www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

හොවාඩ් ඩීන්ගේ නැගීම හා බැසීම

# ඩිමොක්‍රැටික් පක්ෂ දේශපාලනය පිලිබඳ බලගතු පාඩමක්

***The rise and fall of Howard Dean***

**An object lesson in Democratic Party politics**

**ඩේවිඩ් නෝර්ත් සහ බිල් වෑන් ඕකන් විසිනි**
**2004 පෙබරවාරි 19**

ඩිමොක්‍රැටික ජනාධිපති නාම යෝජනා තරගයෙන් ඉවත් වන බවට වර්මොන්ට්හි හිටපු ආන්ඩුකාර හොවාඩ් ඩීන් පෙබරවාරි 18 වන දා කල නිවේදනය මගින් කෙටි සහ උල්කාමය උද්ඝෝෂනයක නිමාව සලකුනු විය. තමා නිසැකව ම ජය ගන්නා බවට ප්‍රකාශිත ප්‍රාන්තයක් වන විස්කොන්සින්හි මැතිවරනයෙන් සියයට 18ක් වැනි කුඩා ඡන්ද ප්‍රතිශතයක් ලබා ගෙන විශාල පරතරයකින් තෙවන ස්ථානයට පත් වීමෙන් පසු, වර්මොන්ට් ප්‍රාන්තයේ බර්ලින්ටන්හි දී ඩීන් මෙම නිවේදනය නිකුත් කලේ ය.

ඩීන්ගේ විස්මිත නැගීම හා බැසීම ඇමරිකානු ද්විපක්ෂ දේශපාලන පද්ධතියේ ස්වභාවය පිලිබඳ අත්‍යවශ්‍ය පාඩම් රැගෙන එයි. ඇමරිකාව තුල ධනේශ්වර දේශපාලන අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා භාවිත කෙරෙන ක්‍රමවේදය, මිනිසුන් ඔසවා තැබෙන හා සමහර අවස්ථාවල දී ක්ෂනිකව පහත හෙලනු ලැබෙන අතිකුරිරු ක්‍රියාවලියක් ලෙස දිගු කලක් තිස්සේ පැවත අවුත් ඇත. කෙසේ නමුත්, මෙවැනි දැඩි සම්මතයන් අනුව බැලුව ද ඩීන්ගේ සිද්ධිය අත්‍යසාමාන්‍යය.

වර්මොන්ට් ආන්ඩුකාර ධුරයේ එකොලොස් වසරක සාපේක්ෂ අප්‍රසිද්ධියක සිට ඩිමොක්‍රැටික පක්ෂ සංස්ථාපිතයට අභියෝග කිරීම සඳහා මතු වූ ඩීන්, ජනාධිපති අපේක්ෂකත්වයේ ඉදිරියෙන් ම සිටින්නා බවට සති හයකට පෙරාතුව අවිවාදිතව පිලිගනු ලැබිනි.

පසු ගිය වසරේ තම උද්ඝෝෂන ව්‍යාපාරය ආරම්භ කරන අවස්ථාවේ ඩිමොක්‍රැටික අපේක්ෂකත්වය සඳහා ඉදිරිපත්ව සිටි අනෙකුත් විභව තරගකරුවන්ගෙන් වෙන් කෙරුනු, ප්‍රතික්ෂේප කල නො හැකි ගුනාංගයන් ඩීන් සතු විය. අනභියෝගී දේශපාලන ප්‍රතිරූපයක් ලෙස මාධ්‍ය මගින් චිත්‍රනය කරන ලද බුෂ්ට -- මෙය ඩිමොක්‍රැටික් පක්ෂයේ බොහෝ දෙනෙකු පිලිගත් කරුනකි -- යථාර්ථය තුල පදනමක් නොමැති බැව් ඩීන්ට අවබෝධ විය. ආක්‍රමනශීලී ප්‍රහාරයකින් පහසුවෙන් ම තුවාල සිදු කල හැකි තන්ත්‍රයක් ලෙස ඔහු බුෂ් පරිපාලනය හඳුනා ගත්තේ ය. බුෂ් පරිපාලනයේ පිලිවෙත් සම්බන්ධයෙන් පමනක් නො ව, ඩිමොක්‍රැටික් පක්ෂය මත් අන් කවර දාටත් වඩා දකුනට ගමන් කිරීමේ දී සහ රිපබ්ලිකානුවන්ට අනුගත වීමේ දී කරන ලද නිවට ක්‍රියාවන් සම්බන්ධයෙන් ද මහජනතාව තුල පුලුල්ව පැතිර ගිය අතෘප්තිය සහ වෛරය තුලට ඩීන්ගේ උද්ඝෝෂනය ගලා ගියේ ය.

අපේක්ෂකයෙකු ලෙස ඇමරිකාවේ දේශපාලන තත්වය සම්බන්ධයෙන් කවර හෝ පුලුල්, වඩාත් වර්ධිත ඉදිරි දර්ශනයක් සම්පාදනය කරනවා වෙනුවට ඩීන් ක්‍රියා කලේ ඉවෙන් හා ප්‍රතිභාවෙනි. දේශපාලනයට අවතීර්න වීමට පෙර කාය වෛද්‍යවරයෙකු වූ ඩීන්ගේ වැඩ පිලිවෙල, ප්‍රතිජීවක වල සිට ඇස්ප්‍රින් පෙත්ත හා නයි තෙල් දක්වා වූ සියල්ල අන්තර්ගත ගම්බද වෙදෙකුගේ බෙහෙත් මල්ලට වඩා වැඩි දෙයක් නො වේ. එය වම, දකුන හා මැද යන ආස්ථානයන් සියල්ලේ සාරසංගෘහිත සම්මිශ්‍රනයක් නියෝජනය කරයි. "ත්‍රස්තයට එරෙහි යුද්ධය" පැහැර හරින්නේ යැයි බුෂ් හෙලා දකින අතර ම ඔහු ඉරාකය තුල යුද්ධය තියුනු ලෙස විවේචනය කරයි. "රජයේ මුදල් අරපරෙස්සමින් භාවිත කිරීමේ වගකීම" "ඩීන් ජනාධිපතිත්වයේ නිල මුද්‍රාව" යැයි ශපථ වන අතර ම ඔහු සර්ව ජන සෞඛ්‍යය ආරක්ෂා කරන ලෙස ඉල්ලා සිටියි.

කෙසේ වෙතත්, ඔහුගේ උද්ඝෝෂන ව්‍යාපාරය, පක්ෂ දෙකේ ම නායකයන් සහ මාධ්‍යයන් විසින් නො තකා හරින ලද යමකට ආමන්ත්‍රනය කිරීමෙන් ගාමකයක් අත් කර ගති: 2000 මැතිවරන සොරකම සම්බන්ධයෙන් දසලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ වැඩෙන කෝපය, ඉරාකය තුල සිදු කෙරෙමින් පවතින නීති විරෝධී යුද්ධය හා ඇමරිකානු මූල්‍ය කතිපයාධිපතිත්වය තව දුරටත් ආඪ්‍ය කිරීම ඒකායන අරමුන කර ගත් ආර්ථික පිලිවෙත්හි බලපෑම.

ඔහුගේ වෙබ් අඩවිය තුල 600,000ක් ආධාරකරුවන් තම සහයෝගී අත්සන යෙදූ අතර ඩොලර් මිලියන 41ක මුදල් ආධාර එකතු විය -- මෙය ඩිමොක්‍රැටික ප්‍රාථමික අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් වාර්තාමය අගයකි. ඔහුගේ උද්ඝෝෂනයට ඉන්ධන සැපයූ දේශපාලනික කලකිරීමේ ගැඹුර පිලිබඳව ඔහු ම කෙතරම් දුරකට අවබෝධ කර ගෙන තිබුනේ ද යන්න අපැහැදිලි ය. කෙසේ වෙතත්, අවිවාදිත කරුන වන්නේ,

2003 වසරේ අවසානය තෙක් නියත වසයෙන් ම ඔහු තමාගේ පිටිය සකස් කර ගෙන තිබුනු බව යි.

මේ පසුබිම තුල ඩීන්ගේ උද්ඝෝෂන ව්‍යාපාරයේ ක්ෂනික බිඳ වැටීම මුලුමනින් ම අත්‍යසාමාන්‍ය සිදුවීමක් බවට පත් විය. ජනවාරිය අවසන් වන විට ඡන්ද ව්‍යාපාරය තුල ඔහුගේ ස්ථානය වේගයෙන් පහත වැටුනු අතර නිව් හැම්ප්ෂයර් සිට විස්කොන්සින් දක්වා ප්‍රාථමික ඡන්ද විමසීම්වල දී කවර හෝ ප්‍රාන්තයක ප්‍රථම ස්ථානය දිනා ගැනීමට ඔහු අසමත් වූ අතර බොහෝ ප්‍රාන්තවල දී ඔහුට ලැබුනේ තෙවන හෝ ඊටත් වඩා පහල ස්ථානයන් ය.

දේශපාලන වාසනා මහිමයේ මෙම ආපසු කැරකීයාම පැහැදිලි කෙරෙනු ඇත්තේ කෙසේ ද? ඉයෝවාහි ඡන්දයේ දී දීර්ඝ පරතරයකින් තෙවන ස්ථානයට පත් වීමෙන් ඉක්බිති ඩීන් පැවැත් වූ අමනෝඥ කතාව පිලිබඳව මාධ්‍ය තුල බොහෝ දේ ප්‍රකාශ විය. "හඬ තැලීම" නමින් සුප්‍රකට මෙය නිමක් නොමැතිව නැවත නැවතත් විකාශය කෙරුනු අතර, රෑ බෝ වී පැවැත්වෙන සංවාද මන්ඩප විහිලු තහලුවල දී උපහාසයට ලක් විය.

පැහැදිලිව ම, මාධ්‍ය මගින් මෙම සිද්ධිය හිතා මතා ම විකෘත කොට උවමනාවට වඩා පුම්බා තැබින. එමගින් මත් ඩීන්ගේ දේශපාලන ක්ෂය වීම සම්බන්ධ සතුටුදායක පැහැදිලි කිරීමක් සම්පාදනය කෙරේ. ඒ කෙසේ වුවත් මෙය අහම්බයක් හෝ දේශපාලනික අර්ථභාරයක් නොමැති දෙයක් හෝ නො වේ.

ඩිමොක්‍රැටික් පක්ෂය තුල ඩීන්ගේ කැරැල්ල ගාමකයක් ගොනු කර ගනිත් ම, එය ගමන් කරමින් සිටියේ කොහි ද යන්න පිලිබඳවත් හිටපු වර්මොන්ට් ආන්ඩුකාරවරයාගේ පිලිවෙත්වල පරස්පර විරෝධයන් පිලිබඳවත් ව්‍යාකූලත්වයන් වර්ධනය විය. තම උද්ඝෝෂන ව්‍යාපාරය බරපතල දුෂ්කරතාවන්ට මුහුන දී සිටින අවස්ථාවක, හිස් සහ ව්‍යාජ නිර්භීතකම හැර දේශපාලන පිලිතුරක මාර්ගයෙන් දෙන්නට යමක් ඩීන් සතු නො වී ය.

යම් මාත්‍රයකට, ඩීන්ගේ උද්ඝෝෂන ව්‍යාපාරය එහි ම පූර්ව සාර්ථකත්වයේ ගොදුරකි. එමෙන් ම එය ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය තුල සිදු වූ දේශපාලන සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස නො තකා හැරෙන සිද්ධීන් බවට පත් කෙරින.

තමාගේ ම ප්‍රචාරක උද්ඝෝෂනයෙන් වශීකෘත මාධ්‍යයන් විසින් හදා වැඩුනු ලද දෘෂ්ටිකෝනයට අනුව "බුෂ් යනු දේශපාලනිකව පහර දී හෙලිය නො හැකි පුද්ගලයෙකු" ලෙස සැලකෙන තාක් දුරට ඩිමොක්‍රැටික් පක්ෂ අපේක්ෂකයා වන්නේ කවරෙකු ද යන්න පිලිබඳව පාලක ප්‍රභූව තුල ඇත්තේ අඩු අවධානයකි.

ඩිමොක්‍රැටික ජනාධිපති අපේක්ෂකයා තෝරා ගැනීමේ ප්‍රාථමික ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කර පිට වී යන අවස්ථාවේ කෙරෙන මත විමසුම්වලින් පෙන්නුම් කෙරෙන්නේ ඡන්දායකයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් "කෝපයේ" හෝ "වෛරයේ" ආකල්පයක් දක්වන බව යි. මේ අනුව ඩිමොක්‍රැටික ප්‍රාථමික ඡන්ද විමසීම්වල දී කැපී පෙනුනු යම් දෙයක් වෙතොත් ඒ ඩීන්ගේ උද්ඝෝෂනය බුෂ් ජනාධිපතිත්වය පිලිබඳව පුලුල් හා වැඩෙන මහජන අතෘප්තියේ එක් දර්ශනයක් බව යි.

මෙම මහජන නො සන්සුන්තාව හා බුෂ් පරිපාලනයේ ව්‍යාකූලත්වය පිලිබඳ එක්සත් ජනපද සංගත සහ මූල්‍ය කවයන් තුල වැඩෙන නො ඉවසිලිවන්ත භාවය අන්තර් ඡේදනය වී ඇත.

නිෂ්ඵල ව්‍යායාමයන් බවට පත්ව ඇති ඉරාකය තුල බුෂ් පරිපාලනයේ පිලිවෙත් සම්බන්ධයෙන් ද නය සහ වෙලඳ පරතරයන් පිලිබඳව එය අනුගමනය කරන පිලිවෙත් මගින් දැවැන්ත ආර්ථික අර්බුදයක කොන්දේසි නිර්මානය වෙතැයි යන භීතිකාවන් සම්බන්ධයෙන් ද පුලුල්ව පැතිරෙන කනස්සලුභාවයක් මෙම කවයන් තුල වර්ධනය වෙමින් පවතී. හිටපු භාන්ඩාගාර ලේකම් පෝල් ඕනීල්ගේ මෑත ම ග්‍රන්ථයෙන්, පිලිවෙත්වල දිශාව සම්බන්ධයෙන් ඔහුගේ ම සිත සසල වීම විස්තර කරනු ලැබීම මෙයට සාක්ෂ්‍යයක් ලෙස දැක්විය හැකි ය.

2004 වර්ෂය ඇරඹෙනවාත් සමග ම බුෂ් වෙනුවට ශක්‍ය ඩිමොක්‍රැටික විකල්පයක් සූදානම් කිරීම ඇමරිකානු පාලක පන්තිය තුල බලගතු අවධානයක් ලෙස මතු විය. ඒ සමග ම, අවසානයේ දී ප්‍රධාන පක්ෂ දෙක ම පාලනය කරන මූල්‍ය කතිපයාධිපතිත්වයට විශ්වාස කල හැකි සහ පිලිගත හැකි අපේක්ෂකයෙකු තෝරා ගැනීමේ පරීක්ෂනයක් බවට ඩිමොක්‍රැටික ප්‍රාථමික ඡන්ද විමසීම් පත් වූයේ අන් කවර දාටත් වඩා පැහැදිලි ආකාරයෙනි.

ඩීන්ගේ අපේක්ෂකත්වය පිලිබඳව මෙම කවයන් තුල පැහැදිලි අපහසුතාවන් පැවතින. එය ඔහුගේ දේශපාලන වැඩ පිලිවෙල සීමාව ඉක්මවා ගිය නිසා ඇති වූවක් නො වේ. ඔහුගේ වැඩ පිලිවෙලින් බොහොමයක් සමන්විත වූයේ පක්ෂ දෙකේ ම දේශපාලනඥයන් බෙදාහදා ගත් ආරක්ෂනවාදී පිලිවෙත්වලිනි. ඒ වෙනුවට, මෙම අපහසුතාව නිර්මානය කල කරුන වූයේ ඩීන් යනු යන්තම් 600,000කට අධික ජනගහනයකින් යුත් ප්‍රාන්ත රාජ්‍යයක ආන්ඩුකාරවරයා ලෙස සේවය කිරීමෙන් පමනක් ලබා ගත් සීමිත අත්දැකීම්වලින් යුත්, කිසි ම දේශපාලන ඉතිහාසයක් නොමැති, සහතික නො කෙරුනු සහ පරීක්ෂාවට ලක් නො වුනු පුද්ගලයෙකු වීම යි. මහජන වෛරයට ආයාචනය කරන තාක් දුරට සහ ශිෂ්‍ය කොටසක ආකර්ෂනය දිනා ගන්නා තාක් දුරට ඔහු වඩාත් සැක කටයුතු පුද්ගලයෙකු ලෙස සැලකින.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, මාධ්‍යයන් විසින් නිර්දයව හා නිරන්තරව සිදු කෙරුනු අවමන් සහගත ප්‍රහාරවලට ඔහු විෂය විය. ඔහුගේ උද්ඝෝෂනය මගින් භාරා අවුස්සන ලද බුෂ් පරිපාලනයට එරෙහි විරුද්ධත්වයේ දැවැන්ත පරිමාව ද මාධ්‍ය විසින් මහජන මතය හැඩ ගැන්වීමට දරන ලද උත්සාහයට බලපෑවේ ය. ධවල මන්දිරයෙන් බුෂ් ඉවතට ඇද දැමීමේ හොඳ ම අවස්ථාව ඇති අපේක්ෂකයා තෝරා ගන්නේ කෙසේ ද යන්න

පිලිබඳ අවධානය ප්‍රාථමික ඡන්ද දායකයන් තුල වඩ වඩාත් වැඩෙන්නට විය. බොහෝ ඡන්ද දායකයන්, "තේරී පත් වීමේ හැකියාව" යන්න සහජාශමය මට්ටමකින් හඳුනා ගත්තේ, පවත්නා දේශපාලන සංස්ථාපිතය විසින් පිලිගනු ලැබීමේ හැකියාව ඇති යන අරුත ගෙන දෙන්නක් ලෙසිනි.

අවසන් සතිවල, ඩීන්ගේ උද්ඝෝෂන ව්‍යාපාරය මගින් සහ ඔහුගේ අපේක්ෂකත්වයට වල කැපීම සඳහා ගෙන යන ලද මෙම සංවිධානාත්මක වැඩ පිලිවෙලට හිටපු වර්මොන්ට් ආන්ඩුකාරවරයා දැක්වූ ප්‍රතිචාරය මගින් දේශපාලනික හා පෞද්ගලික තලයන් දෙකහි ම වැඩෙන කනගාටුදායක තත්වයන් නිර්මානය කෙරින. සියලු දුර්වලතාවන් සහ ඔහුගේ ම පිලිවෙත්වල පරස්පර විරෝධයන් අන් කවර දාටත් වඩා බලගතු ලෙස ඉස්මතු විය.

ඉරාක යුද්ධය හෙලා දකිමින් තම නාම යෝජනා තරගය ආරම්භ කල ඔහු 1991 දී බුෂ්ගේ පියා විසින් දියත් කරන ලද පලමු ගල්ෆ් යුද්ධයේ දී එයට සහයෝගය දීමට අසමත් වීම සම්බන්ධයෙන් නව ඉදිරි-ධාවක මැසචුසෙට්ස් සෙනෙට් සභික ජෝන් කෙරී හෙලා දැකීමේ ක්‍රියාවෙහි වඩාත් නිරතුරුව යෙදී ගත්තේ ය. ඔහු මෙම ප්‍රහාරයන් එල්ල කල ආකාරය අනුව එක් දෙයක් කැපී පෙනුනි. එනම්, එක්සත් ජනපද මිලිටරිවාදයට සහ අධිරාජ්‍යවාදී ආක්‍රමනයට ඩීන්ගේ ම විරුද්ධත්වය, න්‍යායික අවබෝධය මත පදනම් වූ ගැඹුරක් කවර ආකාරයකින් වත් නොමැති අතුරු කතාවක් වූ බව යි.

ඩීන්ගේ ප්‍රධාන තරගකරුවන් විසින් -- කෙරී සහ උතුරු කැරොලිනා සෙනෙට් සභික ජෝන් එඩ්වර්ඩ්ස් විසින් -- යුද්ධය බලාත්මක කිරීම සඳහා ඡන්දය දීමේ දී ඉටු කල තම භූමිකාව යට ගැසීම සඳහා ඔහුගේ යුද විරෝධී පූච්චානම් යොදා ගැනුනු අතර, අවසානයේ දී ඔහුගේ උද්ඝෝෂනය මුලුමනින් ම සාම්ප්‍රදායික ධනේශ්වර දේශපාලනඥයෙකුගේ උද්ඝෝෂනයක් බවට පත් විය.

ඊයේ වර්මොන්ට්හි දී පරාජය පිලිගෙන ඔහු විසින් පවත්වනු ලැබූ කතාවේ දී ඩීන් තම ආධාරකරුවන්ට කියා සිටියේ, "අපේ රට වෙනස් කිරීම සඳහා සහ ඩිමොක්‍රැටික් පක්ෂය පරිවර්තනය කිරීම සඳහා ගත් උත්සාහය ඉදිරියට ම ගෙන යන බව යි."

ඔහු මෙසේ ද පැවසී ය: "හාත් පසින් ම පැහැදිලි කල හොත්, මම ස්වාධීනව හෝ තෙවන පක්ෂයක අපේක්ෂකයෙකු ලෙස හෝ තරගයේ නො යෙදෙන්නෙමි. එවන් වෙනත් අපේක්ෂකයෙකුගේ කවර හෝ ආයාසයකට සහයෝගය දැක්වීම සඳහා නො පෙලඹෙන ලෙස මම මගේ ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටිමි. මූලික අරමුන වන්නේ කවර ආකාරයෙන් හෝ ජෝර්ජ් බුෂ් පරාජය කිරීම යි."

එහෙත්, ඉතා ම නිවැරදිව ගත් කල, ඩීන්ගේ දේශපාලනික නැගීමේ හා බැසීමේ මූලික දේශපාලන පාඩම වන්නේ මෙහි ප්‍රතිවිරුද්ධය යි. බුෂ් පරිපාලනයේ පිලිවෙත්වලට එරෙහිව ගෙන යන සටනේ දී ඇමරිකානු කම්කරු ජනතාව මුහුන දී සිටින මූලික ප්‍රශ්නය නම් ධනේශ්වර ද්විපක්ෂ ක්‍රමයට ප්‍රතිවිරුද්ධ සහ ඉන් පිටස්තර විකල්පයක අවශ්‍යතාව යි.

ඩීන්ගේ ආරම්භක සාර්ථකත්වය, එක්සත් ජනපදය තුල පවත්නා දේශපාලන සංස්ථාපිතයට එරෙහිව වැඩෙන මහජන විරුද්ධත්වයේ රෝගී ලක්ෂනයක් විය. ඔහු සැබෑ මහජන සහයෝගයක් එක් රැස් කර ගන්නා තාක් දුරට එය එසේ වූයේ, ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් දෙපක්ෂයේ ම පිටුබලය ලද සහ යුද්ධය, දේශපාලනික දූෂනය, සමාජ අසමානතාව හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් විනාශ කිරීම සමග අනන්‍ය කෙරුනු දේශපාලන පද්ධතියක් කෙරෙහි පවත්නා දැවැන්ත මහජන අමනාපය ප්‍රකාශ කිරීමට සමත්, කෝප ගැන්වුනු මිනිසෙකුගේ නව මුහනක් ලෙස ඔහු පෙනී ගිය නිසා ය.

දැන් ඔහු තම ආධාරකරුවන්ට කියා සිටින්නේ, තමාගේ පරාජයෙන් ගෙන එන පාඩම වන්නේ නැවත වරක් මෙම පද්ධතියට අවස්ථාවක් ලබා දිය යුතු ය යන්න බව යි. සංස්ථාපිතය හා මාධ්‍ය මගින් විස්තර කෙරුනේ, ඔහුගේ භූමිකාව විය යුත්තේ පූර්වයෙන් කල අයුරින් ඩිමොක්‍රැටික් පක්ෂයේ ආරක්ෂක සීමාවන් තුල සමාජ විරුද්ධත්වයේ මනෝගතීන්ට ආයාචනය කරමින් ඒවා ගාල් කර තබා ගැනීම බව යි.

"නොවැම්බරයේ දී ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් කෙසේ හෝ පරාජය කරනු." හෝ "බුෂ් හැර කවරෙකු හෝ" යන සූත්‍රය ඇමරිකානු කම්කරු මහජනතාවගේ ප්‍රාර්ථනාවන් සපුරා ගැනීම සඳහා කවර හෝ ඉදිරි මාර්ගයක් සම්පාදනය නො කරයි. ඒ වෙනුවට, එය වත්මන් තත්වය පැන නැංවීමට තුඩු දුන් දේශපාලන දර්ශනවාදය විය. ධවල මන්දිරය අරක් ගෙන සිටින තැනැත්තා වෙනස් කිරීමෙන්, ඩිමොක්‍රැටික හා රිපබ්ලිකානු සහාය සමානව භුක්ති විඳි යුදවාදී සහ ප්‍රතිගාමී පිලිවෙත් පැන නැංවූ සමාජ හා ආර්ථික පද්ධතිය වෙනස් නො වේ.

මේ සඳහා, සමාජය විප්ලවවාදී ලෙස පරිවර්තනය කිරීමට සහ මූල්‍ය ප්‍රභූවේ ලාභ අවශ්‍යතා සඳහා ඇමරිකානු මහජනතාව මත පවත්වා ගෙන යනු ලැබෙන ආධිපත්‍යය අවසන් කිරීමට සටන් වදින කම්කරු මහජනතාවගේ නව, ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගීම අවශ්‍ය වේ.

එක්සත් ජනපදය තුල බලගතු දේශපාලන පරිවර්තනයක් සඳහා පූර්වාවශ්‍යතාවක් ලෙස, ඩිමොක්‍රැටික් පක්ෂය මත් අත්‍යාවශ්‍යක ධාරක කුලුනක් වන්නා වූ ධනේශ්වර ද්විපක්ෂ පද්ධතියෙන් නිත්‍ය ලෙස බිඳී වෙන් වීම තීරනාත්මක ය.

අනාගතය පිලිබඳව තකන සියලු දෙනාගෙන් අප ඉල්ලා සිටින්නේ 2004 ජනාධිපතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ උද්ඝෝෂනයට සහාය දෙන ලෙස යි.

© www.wsws.org